## ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය - 2017

-----------------------------------------------

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරිමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1996 අංක 17 දරන ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩල පනතේ 24(3) වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපතිවරයා වෙත 2018 සැප්තැම්බර් 19 දින නිකුත් කරන ලදි

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනිම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරිම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරිම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

------

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

#### 2.2.1 විගණනය සඳහා සාක්ෂි නොවීම්

----------------------------------

මූල්‍ය ප්‍රකාශනවල වෙනත් වගකීම් යටතේ දක්වා ඇති උපචිත දිරි දීමනා රු. 1,797,389 කට අදාලව ගෙවිය යුතු පුද්ගලයින්ගේ නම් ඇතුළු විස්තර විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

#### 2.2.2 නීති, රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------

1996 අංක 17 දරන ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩල පනත 15 (2) වගන්තිය අනුව ඔප්පුව යටතේ ප්‍රතිලාභ අහිමි වී ඇති විට ඒ බව මණ්ඩලය විසින් එම දායකයාට දැන්විය යුතුය. කෙසේ වෙතත් 2015 වර්ෂයේ සිට 2017 ජූලි දක්වා අක්‍රිය වී ඇති දායකයින් හඳුනාගැනීමට නොහැකිවී තිබුණු අතර පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට නොහැකි වී තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.7,714,628 ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා වූ ඌනතාවය රු.705,269 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,419,897 ක පිරිහීමක් දක්නට ලැබුණි. වැටුප් සහ දීමනා ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.5,156,806 කින් වැඩිවීමත් වාහන කල්බදු වියදම රු. 2,928,667 කින් වැඩිවීමත් මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 සහ 2014 වර්ෂවල අතිරික්තයක් පැවතියද 2015 වර්ෂයේ රු.1,596,828 ක ඌණතාවයක්ද 2016 වර්ෂයේදී රු.705,269 ක ඌණතාවයක්ද වූ අතර නැවත 2017 වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලය තවදුරටත් පිරිහී රු.7,714,628 ක ඌණතාවයක් වී තිබුණි. එසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු.69,679,613 ක් වූ දායකත්වය 2015 දක්වා අඛණ්ඩව වර්ධනයවී 2016 වර්ෂයේ සිට නැවත පිරිහී 2017 වර්ෂයේ දී රු.77,844,967 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 සැලසුම් කිරීම

**සංයුක්ත සැලැස්ම**

2014 - 2016 වර්ෂයන් සඳහා මණ්ඩලය විසින් සකස් කරන ලද සංයුක්ත සැලැස්මේ දුර්වලතා සහ බාධක වශයෙන් හඳුනාගත් කරුණු නැවත 2017 – 2019 වර්ෂ සඳහා සකස් කරන ලද සංයුක්ත සැලැස්මට ඇතුළත් කර තිබීමෙන් ඉකුත් වර්ෂ 04 ක් ඇතුළතද මණ්ඩලයට මෙම ගැටළු සඳහා විසඳුම් ලබාගැනීමට නොහැකිවී තිබුණු බව නිරීක්ෂණය විය.

### 4.1.2 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ක්‍රියාකාරී සැලැස්ම

මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම 2016 දෙසැම්බර් 29 අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන තිබුණි. මෙම ක්‍රියාකාරී සැලැස්මට ප්‍රධාන ක්‍රියාකාරකම් 08 ක් ද ඇතුළත් වූ අතර, එහි උපක්‍රියාකාරකම් 34 ක් ඇතුළත් වී තිබුණි. මෙම ක්‍රියාකාරකම් සඳහා ප්‍රධාන දර්ශකයන් ඉදිරිපත් කර තිබුණද සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂයේදීද පහත සඳහන් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

(i) විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ සාමාජික සංඛ්‍යාව සියයට 50 කින් වර්ධනය කිරීමට සමාලෝචිත වර්ෂයේ සාමාජිකයින් 50,000 ක් බඳවා ගැනීම ප්‍රධාන අරමුණක් ලෙස දක්වා තිබුණද දෙසැම්බර් 31 දිනට සක්‍රිය තත්ත්වයේ පසුවන සහ විශ්‍රාම වැටුපට හිමිකම් ලබන සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද යන්න හදුනා ගැනීම.

(ii) දෙපාර්තමේන්තු හා රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතන සමග ඒකාබද්ධව මහජන නියෝජිතයන් විදේශ රැකියාවල නියුක්ත පුද්ගලයන් , වැවිලි කර්මාන්තයන්හි නියුක්තිකයන් රජයේ සහනාධාරලාභීන් වැනි හදුනාගත් කණ්ඩායම් තුලින් කණ්ඩායම් දෙකක් සඳහා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.

(iii) සමාලෝචිත වර්ෂය තුළ නව සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම 05 ක් හදුන්වා දී ක්‍රියාවට නැංවීම.

(iv) සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය රට තුළ ව්‍යාප්ත කිරීමේ අරමුණින් හා සමාජ ආරක්ෂණ යෝජණා ක්‍රම වෙත සාමාජිකයින් ඇතුලත් කර ගැනීමේ අරමුණින් ආරක්ෂණ යෝජනා ක්‍රම පිළිබඳව දායකයින් දැනුවත් කිරීම සඳහා ප්‍රචාරන හා ප්‍රවර්ධන කටයුතු පුළුල් කිරීම පිණිස මාධ්‍ය ඒකකයක් ස්ථාපිත කිරීම.

(v) විශ්‍රාම වැටුප් ලාභින් වෙත වඩාත් කාර්යක්ෂම ගෙවීම් ක්‍රමවේදයක් ඇතිකිරීම පිණිස රාජ්‍ය බැංකු මගින් පමණක් නොව අනෙකුත් පෞද්ගලික බැංකු මඟින් ද විශ්‍රාම වැටුප් ගෙවීම් කටයුතු සිදු කිරීම සඳහා විශ්‍රාම වැටුප් ලාභින් 20,000 ක් සඳහා ගිණුම් විවෘත කිරීමටත් ඉන් සියයට 50 ක් වූ ගිණුම් 10,000ක් සමාලෝචිත වර්ෂය තුළ විවෘත කිරීම.

**(ආ) සමාජ ආරක්ෂණ සඳහා දායකයන් බඳවා ගැනීම,ඔප්පු නිකුත් කිරීම සහ අක්‍රීයවීම**

(i) "සුරකුම සහ"ආරස්සාව" යනුවෙන් පවත්වාගෙන යනු ලබන සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම 02 සඳහා 2017 වර්ෂයේදී "සුරකුම" යෝජනා ක්‍රමයට දායකයින් 8,164 ක් සහ "ආරස්සාව" යෝජනා ක්‍රමයට දායකයින් 54,977 ක් ලෙස නව දායකයින් 63,141 ක් බඳවා ගෙන තිබුණි. එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 12 ක අඩුවීමකි.

(ii) සමාලෝචිත වර්ෂය තුල දායකයන් බඳවා ගැනීම 63,141 වුවද, එම දායකයන්ගෙන් සියයට 24 ක් එනම් 15,759 දෙනෙකුට 2017 දෙසැම්බර් 31 දින වන විටද ඔප්පු නිකුත් කර නොතිබුණි. එසේම මණ්ඩලයේ දැනට සිටින මුළු නිලධාරීන් ගෙන් සියයට 70 ක් සමාජ ආරක්ෂණ අංශයට අනුයුක්ත කර තිබියදීත් එහි කාර්ය සාධනය ඉතා අවම මට්ටමක පැවතිණි.

(iii) 2017 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් සියළු විශ්‍රාම වැටුප් ක්‍රමයන් සඳහා බඳවාගෙන තිබූ සම්පූර්ණ දායකයින් සංඛ්‍යාව 628,786 ක් වූ අතර 2014 දෙසැම්බර් 31 දිනට අක්‍රීය තත්ත්වයේ පැවති දායකයන් සංඛ්‍යාව 288,234 ක් විය. කෙසේ වුවද පවත්නා පද්ධතියේ දුර්වලතාවයක් හේතුවෙන් 2015 ජනවාරි සිට 2018 සැප්තැම්බර් දක්වා අක්‍රීයවන දායකයන් සංඛ්‍යාව හඳුනා ගැනීමට මණ්ඩලයට නොහැකිවී තිබුණු අතර වාර්ෂිකව දායකත්වය අක්‍රීයවීම් ඉහලයෑමේ ප්‍රවණතාවයක් පැවතියද යෝජනා ක්‍රමය තුල ඔවුන් රඳවාගැනීම කෙරෙහි මණ්ඩලයේ අවධානය යොමුවීම අවම මට්ටමක පැවතුණි.

(iv) 2017 වර්ෂය තුල මුළු දායක ලැබීම් රු.196,961,410 ක් වූ අතර දායකයින් සඳහා මුළු ගෙවීම් රු.306,232,747 ක් විය. 2017 දෙසැම්බර් 31 දින වන විට විශ්‍රාම වැටුප් අරමුදල් ගිණුම්වල පැවති ශේෂය රු.2,178,568,478 ක් වුවද එදිනට මණ්ඩලය සතුව පැවති මුළු ආයෝජන වටිනාකම රු.1,988,549,227 ක් විය. ඒ අනුව පසුගිය වර්ෂ කිහිපයක තොරතුරු විශ්ලේෂණයේ දී විශ්‍රාම වැටුප් අරමුදල වෙත දායක මුදල් ලැබීම් වල පහල යාමක් හා විශ්‍රාම වැටුප් ගෙවීම්වල වියදම් ඉහල යාමක් නිරීක්ෂණය විය.

(v) සමාලෝචිත වර්ෂයේදී දායකයන් 1979 දෙනෙකු විසින් තම දායකත්වය අහෝසි කර සාමාජික මුදල් රු.38,055,553 ක් ආපසු ගෙන තිබුණි. ඒ අනුව වාර්ෂිකව දායකයින් විශාල වශයෙන් සාමාජිකත්වය අහෝසිකර මුදල් ආපසු ලබා ගැනීමේ ප්‍රවනතාවයක් විය. එම දායකයන් ඉවත්වයාම වෙනුවට දායකත්වය තවදුරටත් පවත්වාගැනීමට අවශ්‍ය ක්‍රමවේදයන් ඇතිකර ගැනීමට මණ්ඩලය කටයුතු සිදුකර නොතිබුණි.

(vi) මණ්ඩලය විසින් දායකයන් බඳවා ගැනීමේදී මුදල් අයකර ගැනීම සඳහා සම්බන්ධීකරණ නිලධාරීන් වෙත නිකුත් කරනු ලබන කුවිතාන්සි පොත් භාවිතා කර අවසන්වීමෙන් පසුව ගබඩාවට භාරදීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ දිස්ත්‍රික්ක 16 කට නිකුත් කරන ලද කුවිතාන්සි පොත් 1685 ක් භාවිතා කර අවසන්වී තිබුණද, නැවත පොත් ලබාගන්නා අවස්ථාවේ දී එම පොත් ගබඩාවට භාරදි නොතිබුණි.

**(ඇ) පනතේ අරමුණු ඉටු නොකළ අවස්ථා**

1999 අංක 33 දරන සමාජ ආරක්‍ෂණ මණ්ඩලය (සංශෝධන) පනතෙහි පහත දැක්වෙන කර්තව්‍යන් මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(i) ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් දිරිමත් කිරීම, ඔවුන්ගේ හැකියාවන් හා දක්‍ෂතා වැඩිදියුණු කිරීම.

(ii) ස්වයං රැකියාවල යෙදීමට තරුණයන් දිරිමත් කිරීම හා හැකියාවන්, දක්‍ෂතා වැඩි දියුණු කිරීම.

(iii) සකසුරුවම් වීම හා සම්පත් කළමනාකරණයේ ප්‍රතිලාභ පිළිබඳව ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් දැනුවත් කිරීම.

( iv) ස්වයං රැකියාවල නියුතු තැනැත්තන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් විශ්‍රාම වැටුප් අරමුදලින් රු. 23,947,068 ක් වැය කර 2014 වර්ෂයේ නව පරිගණක පද්ධතියක් ස්ථාපිත කර තිබුණද, එමගින් දායකයන් පිළිබඳ තොරතුරු ලබා ගැනීමට නොහැකි වීම, පැරණි හා නව පරිගනක පද්ධති දෙකක් ක්‍රියාත්මකවීම නිසා වාර්තා ගැනීමේ ගැටළු ඇතිවීම, දත්ත ඇතුළත් කිරීමේ පහසුකම් මෙන්ම දත්ත ඇතුළත් කිරීමේදී සිදුවිය හැකි අක්‍රමිකතාවයන් වැළැක්වීම සඳහා ආරක්ෂක ක්‍රියාමාර්ග නොපැවතීම වැනි අඩුපාඩු පැවතුණි.මණ්ඩලයේ පිළිතුරු අනුව මෙම සියළු අඩුපාඩු නිරාකරණය කිරීම සඳහා නව පද්ධතියක් සැකසීමට කටයුතු කරන බව දක්වා තිබුණද එයද 2018 අගෝස්තු 31 දින වනවිටත් ක්‍රියාත්මක කිරීමට නොහැකිවී තිබුණි.

(ආ) 2014 වර්ෂයේ සිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා දායකයන් බඳවා ගැනීම හා වාරික රැස්කිරීම වෙනුවෙන් ඒ සඳහා දායකවන නිලධාරීන්ට දිරිදීමනා ලෙස රු.1,797,389 ක් ගෙවිය යුතුව පැවතිණි.

(ඇ) 2004 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ඉකුත් වර්ෂ 13 තුළ මණ්ඩලයේ දායකයින්ගෙන් ලැබී තිබුණු දායකත්ව මුදලින් රු.1,270,485 ක් හඳුනානොගත් තැන්පතු වශයෙන් දක්වා තිබුණු අතර 2015 වර්ෂයේදී පරිගනක පද්ධතියේ සිදු වූ අක්‍රිය තත්ත්වය හේතුවෙන් නැවතත් දායකයන් හඳුනා ගැනීමට නොහැකි තත්ත්වයක් ඇති වි තිබුණි. මෙම දායක මුදල් බැංකුවල තැන්පත් කිරීමේදී එම බැංකු සහ දායකයන් ඒ පිළිබඳව දැනුවත් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේදීද රු.7,793,825 ක් වශයෙන් එකතුව රු.9,064,310 ක් හඳුනා ගැනීමට නොහැකි තැන්පතු වශයෙන් ගිණුම්වලට ඇතුළත් කර තිබුණි.

(ඈ) දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 ට සම්බන්ධීකරණ නිළධාරීන් 44 ක් සහ කළමනාකාර සහකාර නිලධාරීන් 19 ක් පත් කර තිබුණි. සම්බන්ධීකරණ නිළධාරීන් විසින් දායකයින් බඳවාගැනීමේ කාර්යභාරය සිදුකරන ග්‍රාම නිලධාරීන් දැනුවත් කිරීම, ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත රැස්කරන දායක මුදල් මණ්ඩලය වෙත අප්‍රමාදව ලබාදීම සහ වාරික රැස්කිරීම සම්බන්ධව සම්බන්ධීකරණය කිරීම සිදුකල යුතු වුවද ඒ වෙනුවට එම නිලධාරීන්ද දායකයන් ඍජු බඳවා ගැනීමේ කටයුතුවල නිරතවීම හේතුවෙන් ඔවුන් විසින් ඉටුකළයුතු ඉහත කාර්යයන්හි ප්‍රගතිය අවම මට්ටමක පැවතිණි. එසේම මණ්ඩලයේ කළමනාකරණය විසින් සම්බන්ධීකරණ නිළධාරීන් නිසි අධීක්ෂණයට හා සුපරීක්ෂණයට භාජනය කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැළැස්ම අනුව සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් ක්‍රමයට නව මෘදුකාංග පද්ධතියක් මිළදී ගැනීම සැලසුම් කර තිබුණු අතර ඒ සඳහා ප්‍රසම්පාදන සැලැස්ම තුලින් රු.5,600,000 ක් හා ඉකුත් වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදානයෙන් රු.2,550,946 ක් වශයෙන් රු.8,150,946 ක් ප්‍රතිපාදන සළසාගෙන තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුලදී එම මිළදී ගැනීම අවසන් කර නොතිබුණු අතර 2018 ජූලි 30 දින වන විට ප්‍රසම්පාදනයේදී සැපයුම්කරුවකු තෝරා ගැනීම දක්වා වූ කටයුතු පමණක් අවසන් කර තිබුණි. කෙසේ වුවද වර්ෂ 2 ½ ක කාලයක් ගතවී ඇතත් මෙම පරිගනක පද්ධතිය මිළදී ගැනීමට නොහැකිවූ අතර ඒ හේතුවෙන් මණ්ඩලයේ සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් අරමුදලේ කටයුතු විධිමත් ලෙස පවත්වාගෙනයාමට නොහැකිවී තිබුණි.

## 5. තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 6.1 ප්‍රසම්පාදනයන්

මණ්ඩලය විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණද එය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ දක්වා ඇති 4.2.1 ආකෘතින් අනුව සකස් කර නොතිබුණි. එසේම කාල රාමුව නිර්ණය කිරීම් සහ සිවිල් වැඩ, භාණ්ඩ හා වෙනත් සේවා ලෙස වෙන්කිරීම සිදුකර නොතිබුණු අතර එම සැලැස්ම නිරතුරුවම අධීක්ෂණය කිරීම සහ යාවත්කාලීනව කිරීම සිදු නොවීම නිසා වර්ෂය තුළ ප්‍රාග්ධන මිළදී ගැනීම සඳහා භාණ්ඩාගාරයෙන් ලබාගත් රු. 7,530,000 ක්වූ ප්‍රතිපාදන වලින් රු.5,537,663 ක් හෙවත් සියයට 73.55 ක් ඌණ උපයෝජිතව පැවතිණි.

### 6.2 අයවැය ලේඛණමය පාලනය

අයවැයගත ආදායම් හා වියදම් සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සියයට 35 සිට සියයට 100 දක්වාවූ පරාසයක් තුල විචලනයන් නිරීක්ෂණය වූ බැවින් සඵල කළමනාකරණ පාලන ක්‍රමයක් ලෙස අයවැය යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

## 7. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දූර්වලතාවයන් මණ්ඩලයේ සභාපති වෙත වරින්වර පෙන්වා දෙන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණය |
|---|---|
| (අ) දායක මුදල් රැස්කිරීම | (i) දායකයන් බඳවා ගැනීමේදී ඔප්පු නිකුත් කිරීම ප්‍රමාද තත්ත්වයක පැවතීම<br>(ii) අක්‍රියවන දායකයන් සංඛ්‍යාව නිශ්චිතව හඳුනා ගැනීමට නොහැකි වීම.<br>(iii) බැංකු මගින් රැස් කරන වාරික සටහන් කිරීමේදී දායකයා හඳුනා ගැනීමේ නිශ්චිත ක්‍රමවේදයක් නොමැති බැවින් 2016 දෙසැම්බර් 31 දිනට රු.9,164,309 ක් හඳුනානොගත් තැන්පතු ප්‍රමාණයක් පැවතීම. |
| (ආ) කුවිතාන්සි පොත් නිකුත් කිරීම | කුවිතාන්සි පොත් නිකුත් කිරීම සහ බාරගැනීම නිශ්චිත ක්‍රමවේදයක් අනුව සිදුනොවීම. |
| (ඇ) පරිගණක ගත කිරීම් | පවත්නා පරිගනක පද්ධතිය මණ්ඩලයේ අවශ්‍යතාවයන්ට සරිලන පරිදි නොපැවතීම හේතුවෙන් විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම් ඇති පුද්ගලයන් නිසි පරිදි හඳුනා ගැනිමට අපොහොසත් වීම. |